# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
# அரச கணக்குகள் திணைக்களம்
# Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/APM /02/02/26  ඔබේ අංකය / உமது இல. / Your No.  දිනය / திகதி / Date 2024.10. 28


සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>රජයේ වැටුප් මෘදුකාංගය (GPS ) සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම</u>**

රජයේ ආයතන හා ඒවායේ උප කාර්යාල නිලධාරීන්ගේ වැටුප් සැකසීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති රජයේ වැටුප් සැකසීමේ මෘදුකාංගය (GPS) භාවිතා කරනු ලබයි. ඒ අනුව රජයේ වැටුප් සැකසීමේ මෘදුකාංගය සම්බන්ධයෙන් වැඩිදියුණු කිරීම හා පුහුණු වැඩසටහන් පැවැත්වීම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති අතර දෙපාර්තමේන්තුවේ අවසරයක් නොමැතිව එවැනි කටයුතු කිරීම සඳහා වෙනත් පාර්ශවයන්හට හිමිකාරීත්වයක් නොමැතිබව අවධාරණය කරමි.

02. දැනට භාවිතාකරනු ලබන රජයේ වැටුප් සැකසීමේ මෘදුකාංගයෙහි (GPS) පවතින අඩුපාඩු හඳුනාගෙන නව වැටුප් මෘදුකාංගයක් හඳුන්වාදීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනටමත් කටයුතු කරමින් සිටින අතර නව වැටුප් මෘදුකාංගය හඳුන්වාදෙන තෙක් දැනට පවතින රජයේ වැටුප් සැකසීමේ මෘදුකාංගය (GPS) භාවිතයෙන් වැටුප් සැකසීමේ කටයුතු සිදු කළ යුතුය.

03. රජයේ වැටුප් සකස් කිරීමේ වැඩසටහන (GPS) සම්බන්ධයෙන් විවිධ ආයතන සහ පුද්ගලයන් විසින් පුහුණු වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලබන බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. යම් ආයතනයක් හෝ පුද්ගලයන් විසින් රජයේ වැටුප් සැකසීමේ මෘදුකාංගය (GPS) සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් සංවිධානය කරන්නේනම් ඒ සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ පූර්ව අවසරය ලබාගතයුතු අතර පුහුණු වැඩසටහන අවසානයේ අදාල වැඩසටහන පිළිබඳව තොරතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වාර්තාකළ යුතුය.

04. රජයේ වැටුප් සැකසීමේ මෘදුකාංගය (GPS) සම්බන්ධයෙන් වූ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සම්බන්ධ කිරීමේදී එය විධිමත්ව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අවසරය ඇතිව සංවිධානය කර ඇති වැඩසටහනක්ද යන්න තහවුරු කරගැනීමෙන් පසු පමණක් අදාල පුහුණු වැඩසටහන් සඳහා නම් නිලධාරීන් සහභාගී කරවීමට කටයුතු කරන ලෙස අවධාරණය කරමි. එසේ නොමැතිව අවිධිමත් පුහුණු වැඩසටහන්




මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව  பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை.  General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600  Ext.: 1149  Fax: +94 11 2484869  Website: www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728  Fax: +94 11 2473856  e-mail: dgsa@sad.treasury.gov.lk

මගින් ලබාදෙනු ලබන වැරදි මාර්ගෝපදේශයන් හේතුවෙන් වැටුප් සකස්කිරීමේදී ඊට අදාල නිලධාරීන් විසින් සිදු කරනු ලබන ක්‍රියාවන්හි අහිතකර ප්‍රතිඵල සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත වගකීමක් නොමැති බව අවධාරණය කරමි.

05. රජයේ වැටුප් සැකසීමේ මෘදුකාංගය (GPS) සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පළාත් හා දිස්ත්‍රික්ක මට්ටමින් සංවිධානය කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව කටයුතු සූදානම් කරමින් පවතී. ඒ අනුව රජයේ වැටුප් සැකසීමේ මෘදුකාංගය සම්බන්ධයෙන් පුහුණු වීම අවශ්‍ය වන්නේනම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත අදාල ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු අතර ඒ සඳහා අප දෙපාර්තමේන්තුවේ වෙබ් පිටුවේ පළකර ඇති අයදුම්පත්‍රය භාවිතා කළ යුතුය.

06. මේ පිළිබඳව වැඩිදුර තොරතුරු දුරකතන අංක 011-2034516 හා 011-2484782 මගින් ලබාගැනීමට හැකියාව ඇත.

ඩබ්ලිව්. ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්